ADVICE ON LEGAL MATTERS

GATEWAY LAWYERS

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia

Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au

4 වන පිටෙන්

දත්ත රැස්කර තබාගන්නා (Cloud Computing Services) ඊමේල් ගිණුම් (ජීමේල්, යාහු වැනි) වෙනුවට තමන්ගේ ඩොමේන් නාමයක් යටතේ ඊමේල් ගිණුම් සාදා ගැනීමට බොහෝ පිරිස් පෙළඹව ඇත. තවද අන්තර්ජාලයේ සමූහ දත්ත ගබඩා කොට ඇති ඩ්‍රොප් බොක්ස්, අයි ක්ලවුඩ්ස් වැනි සේවාවලින් ඉවත් වීමට ද පෙළඹවී ඇත.

එමෙන්ම ගූගල්, යාහු වැනි සෙවුම් යන්ත්‍ර වලින් ඉවත්ව, තමන් විසින් පිරික්සන දෑ පිළිබඳව වාර්තා තබා නොගන්නා ඞමජනෘමජනඨද වැනි විකල්ප සෙවුම් යන්ත්‍ර භාවිතා කිරීමට ද පෙළඹවීමක් දක්නට ඇත. එසේ වුවද බහුතරයක් තවමත් තමන්ගේ අන්තර්ජාල භාවිතා කිරීමේ චර්යා රටා වෙනස්කොට නැත්තේ තම ක්‍රියාකාරීත්වයන් මගින් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් නොමැති නිසා මේ තත්ත්වය තමන්ට අදාළ නොවේ යන අදහසිනි.

එක් පසෙකින් සාමාන්‍ය මහජනතාවගේ පෞද්ගලිකත්වය කොන්දේසි විරහිතව ආක්‍රමණය කරන විට බොහෝ රාජ්‍යයන් නිශ්ශබ්දව සිටින අතරතුර සමස්ත යුරෝපයම කැළඹීමට පත්වූයේ ප්‍රංශයේ හා ජර්මනියේ පිහිටි මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාල හරහා සිදුකෙරෙමින් පවතින සන්නිවේදන කටයුතු හැක් කිරීමේ ක්‍රියාදාමයක් පිළිබඳව තොරතුරු අනාවරණය වීමත් සමගය. බර්ලිනයේ පිහිටි මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ ඉහළ සවිකොට ඇති සිලින්ඩරාකාර රාමුවෙහි සවිකොට ඇති යන්ත්‍ර මගින් ඒ අවට ප්‍රදේශයේ සිදුවන සන්නිවේදන කටයුතු අවශෝෂණය කරගත හැකියැයි කියනු ලැබේ. ඊමබාැඒට නැමැති ජර්මනියේ පහළ මන්ත්‍රණ සභාව මෙන්ම ජර්මානු චාන්සලර්වරියගේ කාර්යාලය පිහිටා ඇත්තේ ද ඒ අසළමය. මෙකී අනාවරණය නිසාම ජර්මනිය හා මහා බ්‍රිතාන්‍යය අතර යම් දේශපාලන උණුසුමක් පවතින අතර ජර්මනිය විසින් මහා බ්‍රිතාන්‍ය තානාපතිවරයා කැඳවා ප්‍රශ්ණ කිරීමක්ද සිදුකොට ඇත.

ඇමරිකාව හා චීනය අතර වන සයිබර් යුධ උණුසුම පවතිනුයේ කලක සිටය. සයිබර් ලෝකයේදී දෙපාර්ශ්වයම ක්‍රියාත්මක වුවත්, එය සැබෑ ලෝකයේදී ජීවමාන වූයේ ඉතා අල්ප වශයෙනි. කෙසේ වුවද ස්නෝඩන්ගේ අනාවරණ අතර චීනයේ රාජ්‍ය හා ව්‍යාපාරික තොරතුරු වෙත පිවිසීමට ගන්නා උත්සාහයන් පිළිබඳව ද දක්වා ඇත. ලෝක බලතරගය "භූ දේශාපලනයේ" මෙන්ම "සයිබර් දේශපාලනයේ" ඉදිරියට ඒමක් මේ අනුව දැක ගත හැකිය. බ්‍රසීලය විසින් සමස්ත අන්තර්ජාල පාලනයම තමන් සතුකොට ගත් " අන්තර්ජාලයක්" පිළිබඳව යෝජනා පැමිණෙන්නේ මේ සමගය.එහෙත්, දැඩි ලෙස අන්තර්ජාලයට සීමා පැනවෙන එබඳු උත්සාහයක් තුළින් එහි වර්ධනයට හා නිදහසට විශාල බාධා එල්ලවන බව විශේෂඥයින්ගේ මතය වී තිබේ.

ඉන්දියාව ද රාජ්‍ය සේවකයින්හට ජීමේල් ගිණුම් භාවිතාවෙන් ඉවත්වන ලෙසට දන්වා ඇත. එමෙන්ම රාජ්‍යතාන්ත්‍රිකව වැදගත් ලියුම් පරිගණක භාවිතයෙන් තොරව ටයිප්රයිටර භාවිතාවෙන් සිදුකරන ලෙසට ද ලන්ඩනයේ රාජ්‍ය නිලධාරීන් හට ඉන්දියානු රජය දැනුම්දී ඇත. විදේශ රටවල් සඳහා පිණුම් ගැසීමට ඉඩ සලසා ඇති ලංකාවේ ද පසුගිය කාලයේ අධි ආරක්ෂිත බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයක් ගොඩනැගූ අතර භූ දේශපාලනික ලෙස ලංකාවේ පිහිටීම කවර ආකාරයෙන් පාවිච්චි වන්නේ ද යන කාරණය ගැන අබමල් රේණුවක අදහසක් ලංකාණ්ඩුවේ වාචාල දේශප්‍රේමීන්ට ඇත්දැයි යන්න දන්නේ දෙවියන් පමණය.

තොරතුරු අධිනිශ්චය වූ සමාජයක බලය බවට පත්වන්නේ ඒ වෙත පිවිසීමට ඇති හැකියාවය. වර්චුවල් ලෝකයේ ආධිපත්‍ය කිසිලෙසකින්වත් අවතක්සේරු කළ නොහැකිය.

නීතිය හා සදාචාරය යනු තවමත් බලයට පහළින් පවතින දෙයක් මිස එය හසුරුවන දෙයක් නොවේ. යථාර්ථය ප්‍රශ්න කරනු ලබන්නේ නීතිය හෝ සදාචාරයේ වෙස්ගත් " බලය" විසින්මය..

boondi.lk






දයාවංශ ජයකොඩි සහ සමාගම විසින් වාර්ශිකව පවත්වනු ලබන නවකතා අත්පිටපත් තරගයෙන් 2012 වසරේ මුල්තැන දිනාගත් ජගත් ජේ එදිරිසිංහ ගේ "පිනි" නවකතාවට හිමි සම්මානය සහ ත්‍යාග ප්‍රදානය ඔක්තෝබර් 15 වන දින කොළඹ දී  පැවැත්වුණි මේ එහිදී දයාවංශ ජයකොඩි මහතා විසින් සමරු ඵලකය පුද කළ මොහොතයි ප්‍රවීණ ලේඛක ජයකොඩි සෙනෙවිරත්න මහතාද සේයාරුවේ සිටියි



ජගත්, ලේඛිකා ඉන්ද්‍රා පුෂ්පානි ජයවර්ධන හා සාමා රංජනී කැළණිය මහත්මීන් සමග



සොඳුරු මිනිසුන්ගේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com